# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2135/39 - 2019 අගෝස්තු මස 06 වැනි අඟහරුවාදා - 2019.08.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාත් සභාව

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර මෛත්‍රී ගුණරත්න වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 188 (i) ක.ක. හා 289 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් නියෝග පනවනු ලැබේ. මෙම නියෝගය 2019.05.08 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

### නියෝග

මධ්‍යම පළාතේ දඹුල්ල මහා නගර සභාවේ නගරාධිපතිවරයාට, නියෝජ්‍ය නගරාධිපතිවරයාට හා නගර සභා සභිකයකුට මාසිකව පවත්වන ස්ථාවර කමිටු, අනු කමිටු, උපදේශක මණ්ඩල හා විශේෂ මහා සභා රැස්වීම් වලට සහභාගී වීම වෙනුවෙන් විශේෂ දීමනාවක් ඒ ඒ මහ නගර සභාවේ අරමුදලින් ගෙවීම. මෙම දීමනාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත 1914/40 හා 2015.05.15 දිනැති නියෝගවලට අතිරේකව විය යුතුය.

| | | | |
|---|---|---|---|
| විශේෂ මහා සභා රැස්වීම් සඳහා | - | රු. | 2,000.00 |
| ස්ථාවර කමිටුවක් සඳහා | - | රු. | 750.00 |
| අනු කමිටු හෝ උපදේශක මණ්ඩලයක් සඳහා | - | රු. | 500.00 |

**මෛත්‍රී ගුණරත්න,**
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

2019 මැයි මස 08 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

08 - 798


මෙම *අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - PG 4609 - 107 (2019/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.